# බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ මෝටර් රථ රියදුරන් සඳහා වන ඒකාබද්ධ රියදුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහය

බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් 2002.09.02 දිනැතිව අනුමත කර ඇති 1999.10.01 දින සිට ක්‍රියාත්මක බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ මෝටර් රථ රියදුරන් සඳහා වන ඒකාබද්ධ රියදුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහය හා එයට වරින් වර කරන ලද සංශෝධන වලට අනුව ගන්නා ලද හෝ ඒ යටතේ ගන්නා ලදැයි අදහස් කරන හෝ කිසියම් පියවරකට හානියක් නොවන පරිදි පහත දැක්වෙන බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ මෝටර් රථ රියදුරන් සඳහා වන ඒකාබද්ධ රියදුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහය ආදේශ කරනු ලැබේ.

01. ක්‍රියාත්මක වන දිනය - මෙම සේවා ව්‍යවස්ථා සංග්‍රහය 2013.07.01 දින සිට ක්‍රියාත්මක විය යුතුය.

02. පත්කිරීම් බලධාරියා

2.1 අදාළ සේවකයා සේවය කරන අමාත්‍යාංශයේ ලේකම්වරයා වේ.

2.2 අමාත්‍යාංශයකට අයත් නොවන කාර්යාලයක් වූ විට එම කාර්යාලයේ ප්‍රධානියා වන ලේකම්වරයාය. එනම්, ප්‍රධාන ලේකම් හෝ ආණ්ඩුකාර ලේකම් හෝ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් හෝ සභා ලේකම්වරයාය.

2.3 පළාත් පාලන ආයතනයක් සම්බන්ධයෙන් වූ විට මහා නගර සභාවක නම් නාගරික කොමසාරිස් වරයාද, නගර සභාවක හෝ ප්‍රාදේශීය සභාවක නම් ලේකම් වරයාද වේ.

03. සේවා ගණය - ප්‍රාථමික ශිල්පීය සේවා ගණය

04. පැවරෙන කාර්යභාරය - ආයතනයක් වෙත පැවරෙන කාර්යයන් ඉටුකිරීම හා පවත්වාගෙන යාම සඳහා අත්‍යාවශ්‍ය වන ප්‍රවාහන කාර්යයන් ඉටු කිරීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කෙරෙන මෝටර් රථ රියදුරු බලපත්‍රයක් දරණ තැනැත්තන්ගෙන් සමන්විත සේවා ගණයකි.

4.1 කාර්යයන් පැවරීම - ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර මෙම සේවා ගණයට පැවරෙන ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාවය මත ජ්‍යෙෂ්ඨතාව හා කුසලතාව පදනම් කොට ගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයෙකුට දෙපාර්තමේන්තු ප්‍රධාන /ආයතන ප්‍රධාන විසින් පවරනු ලැබිය හැකිය.

05 වැටුප්

5.1 වැටුප් කේත අංකය - PL3-2006A (රා.ප.ච.6/2006 IV අනුව)

5.2 වැටුප් පරිමාණය - රු. 12,470 – 10 x 130 – 10 x 145 – 10 x 160 – 12 x 170 - රු. 18,860

5.3 ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය |
|---|---|---|
| III | පියවර 01 | රු.12,470/- |
| II | පියවර 12 | රු.13,915/- |
| I | පියවර 22 | රු.15,380/- |
| විශේෂ ශ්‍රේණිය | පියවර 32 | රු.16,990/- |

අනුමත කරමි / නොකරමි

දිනය 2016.02.25

කේ.සී. ලෝගේශ්වරන්
ආණ්ඩුකාර
බස්නාහිර පළාත

06 සේවයට අයත් තනතුරු

6.1 අනුමත තනතුරු නාම, තනතුරු අනුමත ශ්‍රේණි - රියදුරු III, II, I හා විශේෂ

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව - 1710
(තනතුරු අනුමත ආයතන හා තනතුරු සංඛ්‍යාව ඇමුණුම 01 හි දක්වා ඇත)

ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ කාර්යය සඳහා III, II, I හා විශේෂ ශ්‍රේණීන් සියල්ල ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවට අයත් සේ සැලකේ.

6.3 තනතුරෙහි/ තනතුරු වල ස්වභාවය - ස්ථිර විශ්‍රාම වැටුප් සහිතය

07 බඳවා ගැනීමේ ක්‍රමය

7.1 බඳවාගන්නා ප්‍රතිශතයන්

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | 100% |
| සීමිත | |
| කුසලතා | |

7.2 විවෘත බඳවා ගැනීම

7.2.1 බඳවාගන්නා ශ්‍රේණිය - III ශ්‍රේණිය

7.2.2 සුදුසුකම්

7.2.2.1 අධ්‍යාපන සුදුසුකම් - අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සිංහල/දෙමළ භාෂාව ඇතුළුව සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව විෂයයන් හයක් (06) සමත් වී තිබීම.(එක් වරක දී විෂයයන් පහක් (05) අවම වශයෙන් සමත්ව තිබිය යුතුය.)

7.2.2.2 වෘත්තිය සුදුසුකම් -
1. පෞද්ගලික/කුලී රථ සහ තාර බර හොණ්ඩර 24 ට අඩු ස්ටේෂන්වැගන් රථ පැදවීම පිළිබඳව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම.
(බඳවා ගන්නා දිනට වසර තුනක (03) ට පෙර අවම වශයෙන් 'සී' සහ 'සී1' වාහන පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව 'බී' පන්තියේ බලපත්‍රයක් ලබා තිබිය යුතුය.)

2.මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳව මනා දැනුමක් තිබිය යුතුය.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය :1/4/4/300 දිනය :2016/07/25

**සංලක්ෂය:**

ආයතනයේ අවශ්‍යතාවය අනුව පවතින පුරප්පාඩු බර වාහන පැදවීමේ නිපුණතාව සහිත රියදුරන්ගෙන් පිරවීමට ඇති අවස්ථා වලදී බර වාහන රියදුරු බලපත්‍රය (තාර බර හොණ්ඩර් 34 දක්වා වන සැහැල්ලු ලොරි සහ මගීන් 32 ට නොවැඩි සංඛ්‍යාවක් ගෙන යා හැකි බස්රථ සඳහා රියදුරු බලපත්‍රයක් එනම්,'ඒ1' සහ 'සී1' පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව 'බී' සහ 'ඩී1' පන්තියේ බලපත්‍රයක් නැතහොත් තාර බර හොණ්ඩර් 34 ට වැඩි බර මෝටර් වාහන සහ බර ට්‍රේලර් සහ මගීන් 32 ට වඩා ගෙන යා හැකි බලපත්‍ර ලබා ඇති බස් රථ පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද නිපුණතාව පිළිබඳ සහතිකයක් හෝ 'ඒ' පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව 'ඩී' පන්තියේ බලපත්‍රයක් ) මූලික සුදුසුකම වශයෙන් නියම කිරීමට පත්වීම් බලධරයා කටයුතු කරනු ඇත.

7.2.2.3 පළපුරුද්ද - බලපත්‍රය ලැබීමෙන් පසු රියදුරෙකු ලෙස අවම වශයෙන් වසර තුනක (03) පළපුරුද්දක් තිබිය යුතුය. (පළපුරුද්ද විධිමත් සහතිකයක් මගින් සනාථ කළ යුතුය.)

7.2.2.4 කායික සුදුසුකම් - අවම උස අඩි පහක් (5') විය යුතුය.

දිවාකාලයේ හා රාත්‍රීකාලයේදී සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්ත්වයක සිටිය යුතු අතර, මනා ඇස් පෙනීමක් තිබිය යුතුය. රජයේ වෛද්‍ය නිලධාරියකු විසින් නිකුත් කරන ලද වෛද්‍ය සහතිකයක් මගින් ඒ බැව් සනාථ කළ යුතුය.

7.2.2.5 වෙනත් සුදුසුකම් - 1) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

2) අයදුම්කරු යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.

3) අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් අයදුම්පත් ඉදිරිපත් කළ යුතු අවසන් දිනටඅවම වශයෙන් වසර 03 ක් බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිය සනාථ කළ යුතුය.

4) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය 7.2.2 හා 7.2.3 හි සඳහන් සියළුම සුදුසුකම් සම්පූර්ණ කල යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට, එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7.2.3 වයස

7.2.3.1 අවම සීමාව - අවුරුදු 18 ට නොඅඩු

7.2.3.2 උපරිම සීමාව - අවුරුදු 45 ට නොවැඩි

සටහන - (දැනටමත් බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ යෙදී සිටින ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත පත්වීම්ලාභීන් සඳහා උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.)

7.2.4 බඳවාගැනීමේ ක්‍රමය - වෘත්තීය පරීක්ෂණයක් හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් මගින්

7.2.4.1 ලිඛිත විභාගය - අදාළ නොවේ.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය :1/4/4/300 දිනය :2016/02/25

7.2.4.2 වෘත්තීය පරීක්ෂණ

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| I. රිය පැදවීමේ නිපුණත්වය | 40 | 20 |
| II. මාර්ග නීති පිළිබඳ ප්‍රායෝගික දැනුම | 40 | 20 |
| III. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | 20 | 10 |

7.2.4.2.1 වෘත්තීය පරීක්ෂණය පවත්වන බලධරයා -

ඉහත වෘත්තීය පරීක්ෂණය පත්වීම් බලධරයා විසින් පත්කරනු ලබන පහත සඳහන් නිලධාරීන්ගෙන් සමන්විත පරීක්ෂණ මණ්ඩලයක් මගින් පැවත්විය යුතුය.

I. පත්වීම් බලධරයා විසින් පත්කරනු ලබන විධායක/මාණ්ඩලික නිලධාරියෙකු
II. මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් දෙපාර්තමේන්තුවේ මෝටර් රථ වාහන පරීක්ෂකයෙකු
III. පොලිස් රථ වාහන අංශයේ නිලධරයෙකු

7.2.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ

ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු - බඳවා ගැනීමේ මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා පැවත්වේ. ලකුණු ලබා දීමක් සිදු නොකෙරේ.

7.2.4.3.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරන බලධාරියා - අදාල පත්වීම් බලධරයා

7.2.4.4. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය - අදාළ නොවේ.

7.2.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය -
රජයේ ගැසට් පත්‍රයේ දැන්වීම් පළ කිරීම හෝ ප්‍රසිද්ධ දැන්වීම් පළ කිරීම මගින්, මීට අමතරව වෙබ් අඩවියේ දැන්වීම් පළ කිරීමට හැකිය.

7.3 සීමිත බඳවාගැනීම - අදාළ නොවේ.

7.4 කුසලතා පදනම මත බඳවා ගැනීම - අදාළ නොවේ.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය :1/4/4/300 දිනය :2016/07/25

08. කාර්යක්‍ෂමතා කඩඉම්

8.1

| කුමන කාර්යක්ෂමතා කඩඉමද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද | කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය ලිඛිත පරීක්ෂණය/වෘත්තීය පරීක්ෂණය/සහතික පාඨමාලාව/වෙනත් |
|---|---|---|
| පළමු කාර්යක්‍ෂමතා කඩඉම | IIIශ්‍රේණියට බඳවාගෙන වසර තුනක් (03) ගතවීමට පෙර | නිපුණතා පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණය හා වාචික පරීක්ෂණය (01 වන පරිශිෂ්ටය) |
| දෙවන කාර්යක්‍ෂමතා කඩඉම | II ශ්‍රේණියට උසස් වී වසර තුනක් (03) ගතවීමට පෙර | නිපුණතා පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණය (02 වන පරිශිෂ්ටය) |
| තෙවන කාර්යක්‍ෂමතා කඩඉම | Iශ්‍රේණියට උසස් වී වසර පහක් (05) ගතවීමට පෙර | නිපුණතා පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණය (03 වන පරිශිෂ්ටය) |

8.2 කාර්යක්‍ෂමතා කඩඉම් පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක් ද? වසරකට දෙවරක්

8.3 කාර්යක්‍ෂමතා කඩඉම්වලට අදාළ පරීක්‍ෂණ පවත්වනු ලබන බලධරයන් කවුරුන්ද?
අදාළ පත්වීම් බලධරයා විසින් පත් කරනු ලබන පරීක්‍ෂණ මණ්ඩලයක් විසින්

09 භාෂා ප්‍රවීණතාවය

9.1

| භාෂාව | ලබාගත යුතු ප්‍රවීනතාවය |
|---|---|
| 1.රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධරයන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය පරිවාස කාලය තුළ ලබා ගත යුතුය. |
| 2.අනෙක් රාජ්‍ය භාෂාව | රා.ප.ච. 01/2014 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය. |
| 3.සන්ධාන භාෂාව | අදාළ නොවේ. |

10 ශ්‍රේණි උසස් කිරීම - කාර්ය සාධනය පදනම් කරගත් පහත දැක්වෙන ආකාරයේ උසස් වීම් ක්‍රමයක් ක්‍රියාත්මක කෙරේ.

10.1 III වන ශ්‍රේණියේ සිට II වන ශ්‍රේණියට උසස් කිරීම

10.1.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව

10.1.1.1 සපුරාලිය යුතු සුදුසුකම් -

(i) පත්වීම ස්ථිර කර තිබීම.
(ii) සේවා ගණයේ III ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහයක (10) සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා එම කාලසීමාවට අදාළ සියලු වැටුප් වර්ධක උපයාගෙන තිබීම.
(iii) අනුමත කාර්යසාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර දහයක් (10) තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබීම.
(iv) උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළම සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
(v) අදාල මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගෙන තිබීම.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය :1/4/4/300 දිනය :2016/02/25

(vi) කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත්ව් තිබීම.

(vii) තාර බර හොණ්ඩර 34 දක්වා වන සැහැල්ලු ලොරි සහ මගීන් 32 කට නොවැඩිසංඛ්‍යාවක් ගෙන යා හැකි බස් රථ සඳහා රියදුරු බලපත්‍රයක් ලබා තිබීම. ('ඒ 1' සහ 'සී 1' පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව 'බී' සහ 'ඩී1' පන්තියේ බලපත්‍රයක් ලබා තිබිය යුතුය.)

10.1.1.2 උසස්කිරීමේ ක්‍රමය -

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් විසින් නියමිත ආකෘති පත්‍රයෙන් (ඇමුණුම 02) ආයතන ප්‍රධානියා / දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශ සහිතව පත්වීම් බලධරයා වෙත ඉල්ලීමක් කළ විට සුදුසුකම් සම්පූර්ණ කරන දින හෝ වසර 10 ක සේවා කාලය සපුරන දින යන දින දෙකෙන් පසුව එළඹෙන දින සිට ක්‍රියාත්මක වන පරිදි II ශ්‍රේණියට උසස් කිරීම පත්වීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

10.2 II වන ශ්‍රේණියේ සිට I වන ශ්‍රේණියට උසස් කිරීම

10.2.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව

10.2.1.1 සපුරාලිය යුතු සුදුසුකම් -

(i) සේවාගණයේII ශ්‍රේණියේ අවම වශයෙන් වසර නවයක (09) සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා එම කාල සීමාවට අදාළ සියලුම වැටුප් වර්ධක උපයාගෙන තිබීම.

(ii) උසස් කිරීමේ දිනට පූර්වාසන්න වසර පහ (05) තුළම සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

(iii) අනුමත කාර්යසාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස්වීම් දිනට පෙරාතුව වූ වසර නවයක් (09) තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබීම.

(iv) අදාල කාර්යක්‍ෂමතා කඩඉම් පරීක්‍ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

(v) තාර බර හොණ්ඩර 34 ට වැඩි බර මෝටර් වාහන සහ බර ට්‍රේලර්, සහ මගීන් 32 ට වඩා ගෙන යා හැකි බලපත්‍ර ලබා ඇති බස් රථ පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද නිපුණතාවය පිළිබඳ සහතිකයක් ලබා තිබීම.('ඒ' පංතියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව 'ඩී ' පන්තියේ බලපත්‍රයක් ලබා තිබිය යුතුය.)

10.2.1.2 උසස්කිරීමේ ක්‍රමය -

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් විසින් නියමිත ආකෘති පත්‍රයෙන් (ඇමුණුම 02) ආයතන ප්‍රධානියා / දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශ සහිතව පත්වීම් බලධරයා වෙත ඉල්ලීමක් කළ විට සුදුසුකම් සම්පූර්ණ කරන දින හෝ වසර නවයක (09) සේවා කාලය සපුරන දින යන දින දෙකෙන් පසුව එළඹෙන දින සිට ක්‍රියාත්මක වන පරිදි I ශ්‍රේණියට උසස් කිරීම පත්වීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

10.3 I වන ශ්‍රේණියේ සිට විශේෂ ශ්‍රේණියට උසස් කිරීම

10.3.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : 4/4/4/300 දිනය : 2016/02/25

10.3.1.1 සපුරාලිය යුතු සුදුසුකම් -

(i) සේවා ගණයේ I ශ්‍රේණියේ අවම වශයෙන් වසර නවයක (09) සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා එම කාලසීමාවට අදාළ සියලු වැටුප් වර්ධක උපයාගෙන තිබීම.
(ii) උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
(iii) අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර නවයක් (09) තුළම සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබීම.
(iv) අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

10.3.1.2 උසස්කිරීමේ ක්‍රමය -

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් විසින් නියමිත ආකෘති පත්‍රයෙන් (ඇමුණුම 02) ආයතන ප්‍රධානියාගේ/දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශ සහිතව පත්වීම් බලධරයා වෙත ඉල්ලීමක් කළ විට පත්වීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් සම්පූර්ණ කරන දින හෝ වසර 09 ක සේවා කාලය සපුරන දින යන දින දෙකෙන් පසුව එළඹෙන දින සිට ක්‍රියාත්මක වන පරිදි විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සිදු කරනු ලැබේ.

**සංලක්ෂය :**
උසස් කිරීමේදී නියමිත දිනට කාර්යක්ෂමතා කඩඉම සමත් නොවන නිලධාරින්ගේ උසස්වීම් දිනය කාර්යක්ෂමතා කඩඉම සමත් වීමට ප්‍රමාද වූ කාලයට සමාන කාලයකින් ප්‍රමාද කල යුතුය.

11 සේවයට අදාල කොන්දේසි -

සේවයේ III වන ශ්‍රේණියට පත් කරනු ලැබූ නිලධාරියෙකු තුන් වසරක (03) පරිවාස කාලයකට යටත්ව පත් කරනු ලබන අතර ඔහු පරිවාස කාලය තුළ සිය රාජකාරි වැඩ හා හැසිරීම,සේවයට පැමිණීම,සතුටුදායක අන්දමින් පවත්වාගෙන ගොස් තිබේ නම් සහ පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වී තිබේ නම් පරිවාස කාලය අවසානයේ දී සේවය ස්ථිර කරනු ලැබේ.

12 අර්ථ නිරූපන හා නිර්වචන -

12.1 "ව්‍යවස්ථා සංග්‍රහය" යන පදයෙන් අදහස් කෙරෙන්නේ බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ මෝටර් රථ රියදුරන් සඳහා වන ඒකාබද්ධ රියදුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයයි.

12.2 "සේවය" යන පදයෙන් අදහස් කෙරෙන්නේ බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ මෝටර් රථ රියදුරු සේවයයි.

12.3 "සතුටුදායක සේවා කාලය"

(i) පළාත් සභා රාජ්‍ය සේවයේ නිලධාරියකු විසින් කාර්යක්ෂමව හා අනලස්ව රාජකාරිය ඉටු කිරීම මගින් ද, සමත් විය යුතුව තිබූ කාර්යක්ෂමතා කඩඉම් සමත්වීම මගින් ද, සිදු කළ යුතුව තිබූ පත්වීම ස්ථිර කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කිරීම මගින් ද, එම කාලය තුළදී උපයාගත යුතුව තිබූ සියළුම වැටුප් වර්ධක උපයාගෙන ඇත්තා වූ සහ ඔහු විසින් දඩුවම් ලැබිය යුතු වරදක් සිදු නොකරන ලද්දා වූ කාලසීමාවක් වන්නේය.

(ii) නිලධරයා වෙත ලබා දිය යුතුව තිබූ වාර්ෂික වැටුප් වර්ධක නීත්‍යානුකූල හේතු මත අත්හිටුවා, අඩු කොට, නතර කොට හෝ විලම්භනය කොට ඇති කාල පරිච්ඡේදයක් වේ නම් එය ද, ආයතන සංග්‍රහයේ II කොටසේ වැරදි පිළිබඳ පළමු වැනි උපලේඛනය යටතේ දඩුවම් ලැබිය හැකි වරදක් සිදුකර ඇති විටක එම වරද සිදු කරනු ලැබූ දින සිට වසර 03ක කාලයක් ද, සහ ආයතන සංග්‍රහයේ II කොටසේ වැරදි පිළිබඳ දෙවන උපලේඛණය යටතේ දඩුවම් ලැබිය හැකි වරදක් සිදුකර ඇති විටක එම වරද සිදු කරනු ලැබූ දින සිට එක් වසරක කාලයක් ද සතුටුදායක සේවා කාලය ගණනය කිරීමේදී බැහැර කළ යුතු වන්නේය.



ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : 1/4/4/360 දිනය : 2016/02/25

12.4 "සක්‍රිය සේවා කාලය" යනු ස්වකීය තනතුරට අදාල වැටුප් ලබමින් සත්‍ය වශයෙන්ම රාජකාරියෙහි යෙදී සිටි සේවා කාලය වේ. රජයෙන් අනුමත ප්‍රසූත නිවාඩු හැර අනෙකුත් සියළුම වැටුප් රහිත නිවාඩු කාල පරිච්ඡේදයන් සක්‍රිය සේවා කාලය සඳහා ගණනය කරනු නොලබන්නේය.

12.5 "නියමිත දිනට" අදාළ කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතු දිනය "නියමිත දිනය" ලෙස අදහස් කෙරේ. ශ්‍රේණි උසස් වීම් වලදී නියමිත දිනට හෝ ඊට පෙර කාර්යක්ෂමතා කඩඉම සමත් වන නිලධාරීන්ට සේවා ව්‍යවස්ථාවේ සඳහන් පරිදි උසස් වීම් ලැබීමට හිමිකමක් ඇත.නියමිත දිනට සමත් නොවන නිලධාරීන්ගේ උසස් වීම් දිනය කාර්යක්ෂමතා කඩඉම සමත් වීමට ප්‍රමාද වූ කාලයට සමාන කාලයකින් ප්‍රමාද කල යුතුය.

උදා : වසර තුනකදි සමත් විය යුතු කාර්යක්ෂමතා කඩඉම වසර හතරකින් සමත් වූවහොත් වසර දහයකින් ලැබිය යුතු උසස් වීම් ලැබෙනුයේ වසර එකොළහකිනි.

13 ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය -

මෙම සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනට සේවයේ යෙදී සිටින්නන්ට පමණක් අදාළ වේ. නියමිත දිනට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ මගින් ලබා දී ඇති PL-03-2006A වැටුප් පරිමාණය යටතේ වැටුප් ලබන නිලධාරීන් සියලුදෙනාම ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 04 වන වගන්තියේ විධිවිධාන වලට යටත්ව පහත සඳහන් පරිදි අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

සේවා කාලය ගණන් ගනු ලබන්නේ ඒ ඒ තනතුරට පත් කරන ලද දිනය පදනම් කර ගෙනය. කෙසේ වතුදු අන්තර්ග්‍රහණය හේතුවෙන් අදාළ තැනත්තාගේ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවිය යුතු අතර, එම දිනය අන්තර්ග්‍රහණයට පෙර පැවති වැටුප් වර්ධක දිනය වශයෙන් නොවෙනස්ව පවතී. එසේම වැටුප් පරිවර්තනයේදි අදාළ තැනත්තා අවසන් වරට ලබමින් සිටි වැටුප් පියවරට අනුරූපී වීම මත ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4.4 වගන්තිය අනුව ඊළග ඉහළ වැටුප් පියවරේ තැබීමද සිදු නොකළ යුතුය.

නව ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනට,

i. ඒකාබද්ධ රියදුරු සේවයේ II "ආ" පන්තියේ හෝ III ශ්‍රේණියේ/පන්තියේ සේවයේ නියුතු නිලධාරීන් III ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කෙරේ.
ii. ඒකාබද්ධ රියදුරු සේවයේ II "අ" පන්තියේ හෝ II ශ්‍රේණියේ/පන්තියේ සේවයේ නියුතු නිලධාරීන් II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කෙරේ.
iii. ඒකාබද්ධ රියදුරු සේවයේ I පන්තියේ සේවයේ නියුතු නිලධාරීන් I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කෙරේ.
iv. ඒකාබද්ධ රියදුරු සේවයේ I පන්තියේ වසර (09) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති හා වැටුප් වර්ධක නවයක් (09) උපයාගෙන ඇති සහ අනෙකුත් සේවා අවශ්‍යතා සපුරා ඇති නිලධාරීන් විශේෂ ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කෙරේ.

**සටහන :** උසස් කිරීමේ කාර්යයේදී II "ආ" පංතියේ සේවා කාලය III ශ්‍රේණියේ සේවා කාලය වශයෙන්ද, II "අ" පන්තියේ සේවා කාලය II ශ්‍රේණියේ සේවා කාලය වශයෙන්ද, I පන්තියේ සේවා කාලය I ශ්‍රේණියේ සේවා කාලය වශයෙන්ද සලකා කටයුතු කරනු ඇත.

14 අන්තර්කාලීන විධිවිධාන -

14.1 සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනට පැරණි ව්‍යවස්ථාව යටතේ I පන්තියට පත්වී සිටින නිලධරයන් I ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කෙරේ.

14.2 දැනට සේවයේ නියුතු නිලධාරීන් සම්බන්ධයෙන් මෙම ව්‍යවස්ථාවේ විධිවිධාන අනුකූල වීමට ව්‍යවස්ථාව අනුමත වන දිනයේ සිට වසර තුනක (03) ක සහන කාලයක් ලබා දෙනු ලැබේ. එම කාලය තුළ ඔවුන් විසින් නව ඒකාබද්ධ රියදුරු සේවා ව්‍යවස්ථාවේ සඳහන් සුදුසුකම් සපුරා ගත යුතුය. මෙහිලා සුදුසුකම් යනුවෙන් අදහස් කරනුයේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් වීමයි.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය :...1/4/4/30 දිනය :2016/02/25

15. වෙනත් කරුණු -

15.1 **බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ දැක්වෙන පොදු කොන්දේසි වලට පරිබාහිර වන්නා වූ කොන්දේසි :-**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධාන වලටද, බස්නාහිර පළාත් සභා මූල්‍ය රීති සංග්‍රහයටද, කලින් කල බස්නාහිර පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමා විසින් පනවනු ලබන රෙගුලාසි නොහොත් නියෝග වලටද, බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කල පනවනු ලබන වෙනත් රෙගුලාසි නොහොත් නියෝග වලටද, අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු නියෝගවලටද අනුව කටයුතු කල යුතුය.

15.2 **බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ දැක්වෙන අර්ථ නිරූපණවලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ :-**

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපන වලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපන කිසිවක් වෙතොත් ඒ සම්බන්ධයෙන් බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව/බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විමසා කටයුතු කරනු ඇත.

15.3 සේවකයින් ස්ථාන මාරු කරනු ලැබීමට යටත් වෙති. ඔවුන් පළාතේ කවර හෝ පෙදෙසකට පත්කර යැවීමට පුළුවන.

15.2.1 ස්ථාන මාරු කිරීමේ බලධාරීත්වය පහත දැක්වෙන පරිදි වේ.

15.2.2 අමාත්‍යාංශ අතර හා අමාත්‍යාංශයකට නොවැටෙන දෙපාර්තමේන්තු අතර ස්ථානමාරු කිරීම් බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් විසිනි.

15.2.3 එකම අමාත්‍යාංශය තුළ දෙපාර්තමේන්තු අතර ස්ථාන මාරු කිරීම් අදාළ අමාත්‍යාංශ ලේකම් විසිනි.

15.2.4 එකම දෙපාර්තමේන්තුව තුළ මාරු කිරීම් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසිනි.

16. මෙම ව්‍යවස්ථාවේ විධිවිධාන සලසා ඇති කරුණු සම්බන්ධ ගැටළු පැන නගින අවස්ථාවකදී හා /හෝ මෙම ව්‍යවස්ථාවෙහි විධිවිධාන සලසා නොමැති කරුණු සම්බන්ධයෙන් බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාර තුමා විමසා තීරණය කරනු ඇත.

## 1 වන පරිශිෂ්ටය

01 . විභාගයේ නම - බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ ඒකාබද්ධ රියදුරු සේවයේ නිලධාරින්සඳහා වනපළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය.

02 . විභාගය පිළිබඳ විස්තර - නිපුණතා පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණයක් හා වාචික පරීක්ෂණයකි

| | විෂය ක්ෂේත්‍රය | මුළු ලකුණු | අවම සමත් ලකුණ |
|---|---|---|---|
| I. | නිපුණතා පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණය | 50 | 20 |
| II. | වාචික පරීක්ෂණය | 50 | 20 |
| | එකතුව | 100 | 40 |

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය :1/4/4/300 දිනය : 2016/02/25

03. විභාගය පවත්වනු ලබන බලධරයා

- නිපුණතා පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණය

  පත්වීම් බලධරයා විසින් පත්කරනු ලබන පහත සඳහන් නිලධාරින්ගෙන් සමන්විත පරීක්ෂණ මණ්ඩලයක් මගින් පැවත්විය යුතුය.

  I. පත්වීම් බලධරයා විසින් පත්කරනු ලබන විධායක/මාණ්ඩලික මට්ටමේ නිලධාරියෙකු සභාපති ලෙස
  II. මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් දෙපාර්තමේන්තුවේ මෝටර් රථ පරීක්ෂකයෙකු
  III. පොලිස් රථ වාහන අංශයේ නිලධරයෙකු

- වාචික පරීක්ෂණය

  පත්වීම් බලධරයා විසින් පත්කරනු ලබන පහත සඳහන් නිලධාරින්ගෙන් යුත් පරීක්ෂණ මණ්ඩලයක් මගින් පැවත්විය යුතුය.

  I. පත්වීම් බලධාරියා විසින් පත්කරනු ලබන විධායක / මාණ්ඩලික මට්ටමේ නිලධාරියෙකු සභාපති ලෙස
  II. අදාළ අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ පරිබාහිර දෙපාර්තමේන්තුවක විධායක/ මාණ්ඩලික මට්ටමේ නිලධාරියෙකු

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : වසරකට දෙවරක්

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය

| විෂය ක්ෂේත්‍රය | විෂය නිර්දේශය |
|---|---|
| නිපුණතා පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණය | 1.මහාමාර්ග නීතිය පිළිබඳ ප්‍රායෝගික දැනුම.<br>2.මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම |
| වාචික පරීක්ෂණය<br>1. ආයතන සංග්‍රහයේ විධිවිධාන හා බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කාර්ය පටිපාටික රීති පිළිබඳ මූලික දැනුම<br><br>2. රජයේ වාහන පරිහරණය හා නඩත්තුව පිළිබඳ දැනුම | පරිවාස කාලය, කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ, අතිකාල දීමනා, නිවාඩු, දුම්රිය බලපත්‍ර, ලිපි ගනුදෙනු කිරීමේ මාර්ග, සාමාන්‍ය හැසිරීම හා විනය<br><br>❖ මෝටර් රථ රියදුරන්ගේ රාජකාරි හා වගකීම්<br>❖ රජයේ වාහන නඩත්තු කිරීම හා ආරක්ෂාව සම්බන්ධයෙන් රියදුරුගේ වගකීම<br>❖ දෛනික ධාවන සටහන් පොත්<br>❖ වාහන ඉන්වෙන්ට්රි පවත්වාගෙන යාම<br>❖ වාහන අළුත්වැඩියාව හා සේවා කටයුතු<br>❖ රජයේ වාහන වලට සිදුවන අනතුරු හා අනතුරු සම්බන්ධයෙන් ගතයුතු ක්‍රියා මාර්ග |

**සටහන : කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ වලදි විෂයයන් සියල්ල එකවර සමත් විය යුතුය.**

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය :1/4/4/300... දිනය : 2016/02/25

## 2 වන පරිශිෂ්ටය

01. විභාගයේ නම - බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ ඒකාබද්ධ රියදුරු සේවයේ නිලධාරීන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය.

02. විභාගය පිළිබඳ විස්තර - නිපුණතා පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණයකි.

| විෂය ක්ෂේත්‍රය | මුළු ලකුණු | අවම සමත් ලකුණ |
|---|---|---|
| **නිපුණතා පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණය** | | |
| 1.මහාමාර්ග නීති පිළිබඳ ප්‍රායෝගික දැනීම | 50 | 20 |
| 2.මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | 50 | 20 |
| එකතුව | 100 | 40 |

03. විභාගය පවත්වනු ලබන බලධරයා

පත්වීම් බලධරයා විසින් පත්කරනු ලබන පහත සඳහන් නිලධාරීන්ගෙන් සමන්විත තිදෙනෙකුට නොඅඩු පරීක්ෂණ මණ්ඩලයක් මගින් පැවත්විය යුතුය.

I. පත්වීම් බලධරයා විසින් පත්කරනු ලබන විධායක/මාණ්ඩලික මට්ටමේ නිලධාරියෙකු සභාපති ලෙස
II. මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් දෙපාර්තමේන්තුවේ මෝටර් රථ වාහන පරීක්ෂකයෙකු
III. පොලිස් රථ වාහන අංශයේ නිලධරයෙකු

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : වසරකට දෙවරක්

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය

| විෂය ක්ෂේත්‍රය | විෂය නිර්දේශය |
|---|---|
| 01. මහාමාර්ග නීතිය පිළිබඳ ප්‍රායෝගික දැනුම<br><br>02.මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | මෙම ක්ෂේත්‍ර සම්බන්ධයෙන් ගත වූ සේවා කාලය තුල සිදු වී ඇති පටිපාටිමය, නීතිමය වෙනස්වීම් හා නිලධාරියාගේ ශිල්පීය ප්‍රවීණතාව එම නිලධාරියාගේ ජොෂ්ඨත්වයට ගැලපෙන පරිදි වර්ධනය වී ඇත්දැයි මැන බැලීම සිදු කෙරේ. |

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : 1/4/4/300 දිනය : 2016/02/25

## 3 වන පරිශිෂ්ටය

01. විභාගයේ නම - බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ ඒකාබද්ධ රියදුරු සේවයේ නිලධාරින් සඳහා වන තුන්වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය.

02. විභාගය පිළිබඳ විස්තර - නිපුණතා පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණයකි.

| විෂය ක්ෂේත්‍රය | මුළු ලකුණු | අවම සමත් ලකුණු |
|---|---|---|
| නිපුණතා පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණයකි | | |
| 1.මහාමාර්ග නීති පිළිබඳ ප්‍රායෝගික දැනීම | 50 | 20 |
| 2.මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | 50 | 20 |
| එකතුව | 100 | 40 |

03. විභාගය පවත්වනු ලබන බලධරයා

පත්වීම් බලධරයා විසින් පත්කරනු ලබන පහත සඳහන් නිලධාරින්ගෙන් සමන්විත පරීක්ෂණ මණ්ඩලයක් මගින් පැවත්විය යුතුය.

I. පත්වීම් බලධරයා විසින් පත්කරනු ලබන විධායක / මාණ්ඩලික මට්ටමේ නිලධාරියෙකු සභාපති ලෙස
II. මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් දෙපාර්තමේන්තුවේ මෝටර් රථ වාහන පරීක්ෂකයෙකු
III. පොලිස් රථ වාහන අංශයේ නිලධරයෙකු

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : වසරකට දෙවරක්

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය

| විෂය ක්ෂේත්‍රය | විෂය නිර්දේශය |
|---|---|
| 1. මහාමාර්ග නීති පිළිබඳ ප්‍රායෝගික දැනුම<br><br>2.මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | මහාමාර්ග නීති හා මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳව දැනුමට අමතරව නිලධාරියාගේ ශිල්පීය ප්‍රවීණතාවය එම නිලධාරියාගේ ජ්‍යෙෂ්ඨත්වයට ගැළපෙන පරිදි වර්ධනය වී ඇත්දැයි යන්න හා නිලධාරියා සේවය කරන ආයතනයට පැවරෙන කාර්යයන් පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් ලබාගෙන ඇත්ද යන්න මැන බැලීම. |

සකස් කළේ : අත්සන: ....................
(විෂය භාර නිලධාරියා)

නම : ඩී. ඒ. වනිගසේකර
තනතුර : කළමණාකරණ සහකාර
දිනය : 2015-11-02

පරික්ෂා කළේ : අත්සන: ....................
(විෂය භාර මාණ්ඩලික නිලධාරියා)

නම : එස්. එම්.එච්. කුසුම්සිරි
තනතුර : පරිපාලන නිලධාරී
ප්‍රධාන ලේකම් කාර්යාලය,
දිනය : බස්නාහිර පළාත් සභාව.
2015/11/06

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : 14/4/300 දිනය : 2016/02/25

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ...............................................
(දෙපාර්තමේන්තු ප්‍රධාන)
නම :
තනතුර :
දිනය :

යොමු අංකය : CSO/PTR/11/2/1

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ මෝටර් රථ රියදුරන් සඳහා වන ඒකාබද්ධ රියදුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන : ...............................................
නම : ...............................................
ප්‍රධාන ලේකම් (බ.ප.)

දිනය : 2015/11/16

නිල මුද්‍රාව :
ජේ. එම්. සී. ජයන්ති විජේතුංග
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

යොමු අංකය : 1/4/2/5/11

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ මෝටර් රථ රියදුරන් සඳහා වන ඒකාබද්ධ රියදුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිර්දේශ කර ඇත.

අත්සන : ...............................................
නම : ...............................................
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.)

දිනය : 2016/02/01

නිල මුද්‍රාව :
වී. රාජපක්ෂ
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
බස්නාහිර පළාත

යොමු අංකය : 1/4/4/300

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ මෝටර් රථ රියදුරන් සඳහා වන ඒකාබද්ධ රියදුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහය 2016.02.25 දින ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී..

අත්සන : ...............................................
නම : ...............................................
ආණ්ඩුකාර ලේකම් (බ.ප.)

දිනය : 2016.02.25

නිල මුද්‍රාව :

පී. සෝමසිරි
ආණ්ඩුකාර ලේකම්
බ.ප. ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
05වන මහල, රොටුන්ඩා ගොඩනැගිල්ල,
අංක: 109, ගාලු පාර, කොළඹ 03.

ඇමුණුම 01

<u>බස්නාහිර පළාත් සභාව සඳහා අනුමත රියදුරු සේවයේ තනතුරු සංඛ්‍යාව පිළිබඳ උපලේඛණය</u>

| ආයතනය | අනුමත තනතුරු සංඛ්‍යාව |
|---|---|
| ආණ්ඩුකාර ලේකම් කාර්යාලය | 03 |
| පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව | 03 |
| සභා ලේකම් කාර්යාලය | 07 |
| ප්‍රධාන ලේකම් කාර්යාලය | 12 |
| නීති ඒකකය | 02 |
| නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) කාර්යාලය | 02 |
| මානව සම්පත් සංවර්ධන හා කළමනාකරණ පුහුණු ආයතනය | 01 |
| පළාත් අභ්‍යන්තර විගණන අංශය | 02 |
| නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) කාර්යාලය | 05 |
| නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) කාර්යාලය | 06 |
| බස්නාහිර පළාත් ඉංජිනේරු කාර්යාංශය | 23 |
| පළාත් ආදායම් දෙපාර්තමේන්තුව | 10 |
| පළාත් ව්‍යාපාර නාම රෙජිස්ට්‍රාර් කාර්යාලය | 01 |
| මුදල් හා ක්‍රම සම්පාදන,ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, ඉඩම්, පළාත් පාලන, පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන,විදුලිබල හා බලශක්ති,පරිසර කටයුතු,ජල සම්පාදන හා ජලපවාහන සහ සංචාරක කටයුතු අමාත්‍යාංශය (බ.ප.) | 09 |
| පළාත් පාලන දෙපාර්තමේන්තුව | 07 |
| කොළඹ මහ නගර සභාව | 613 |
| දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව | 100 |
| මොරටුව මහ නගර සභාව | 51 |
| ලුනාව ව්‍යාපෘතිය | 04 |
| ශ්‍රී ජයවර්ධන පුර කෝට්ටේ මහ නගර සභාව | 52 |
| ගම්පහ මහ නගර සභාව | 28 |
| මීගමුව මහ නගර සභාව | 54 |
| කඩුවෙල මහ නගර සභාව | 46 |
| බොරලැස්ගමුව නගර සභාව | 11 |
| කැස්බෑව නගර සභාව | 18 |
| කොලොන්නාව නගර සභාව | 18 |
| මහරගම නගර සභාව | 31 |
| සීතාවකපුර නගර සභාව | 13 |
| ජා ඇල නගර සභාව | 12 |
| කටුනායක සීදූව නගර සභාව | 14 |
| මිනුවන්ගොඩ නගර සභාව | 08 |
| පෑලියගොඩ නගර සභාව | 09 |
| වත්තල මා බෝල නගර සභාව | 08 |
| බේරුවල නගර සභාව | 10 |
| හොරණ නගර සභාව | 06 |
| කළුතර නගර සභාව | 14 |
| පානදුර නගර සභාව | 13 |
| හෝමාගම ප්‍රාදේශීය සභාව | 14 |
| කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව | 17 |
| සීතාවක ප්‍රාදේශීය සභාව | 11 |



ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : 1/4/4/300 දිනය : 2016/02/25

| | |
|---|---|
| අත්තනගල්ල ප්‍රාදේශීය සභාව | 13 |
| බියගම ප්‍රාදේශීය සභාව | 12 |
| දිවුලපිටිය ප්‍රාදේශීය සභාව | 11 |
| දොම්පේ ප්‍රාදේශීය සභාව | 11 |
| ගම්පහ ප්‍රාදේශීය සභාව | 13 |
| ජා ඇල ප්‍රාදේශීය සභාව | 20 |
| කැළණිය ප්‍රාදේශීය සභාව | 17 |
| කටාන ප්‍රාදේශීය සභාව | 21 |
| මහර ප්‍රාදේශීය සභාව | 11 |
| මීනුවන්ගොඩ ප්‍රාදේශීය සභාව | 10 |
| මීරිගම ප්‍රාදේශීය සභාව | 12 |
| වත්තල ප්‍රාදේශීය සභාව | 14 |
| අගලවත්ත ප්‍රාදේශීය සභාව | 08 |
| බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව | 11 |
| බේරුවල ප්‍රාදේශීය සභාව | 10 |
| බුලත්සිංහල ප්‍රාදේශීය සභාව | 12 |
| දොඩංගොඩ ප්‍රාදේශීය සභාව | 07 |
| හොරණ ප්‍රාදේශීය සභාව | 12 |
| කළුතර ප්‍රාදේශීය සභාව | 13 |
| මදුරාවල ප්‍රාදේශීය සභාව | 05 |
| මතුගම ප්‍රාදේශීය සභාව | 08 |
| පාලින්දනුවර ප්‍රාදේශීය සභාව | 05 |
| පානදුර ප්‍රාදේශීය සභාව | 12 |
| වලල්ලාවිට ප්‍රාදේශීය සභාව | 07 |
| පළාත් අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු ක්‍රීඩා, යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය (බ.ප.) | 12 |
| පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව | 10 |
| කලාප අධ්‍යාපන කාර්යාලය - මීගමුව | 01 |
| කලාප අධ්‍යාපන කාර්යාලය - මීනුවන්ගොඩ | 01 |
| කලාප අධ්‍යාපන කාර්යාලය - ගම්පහ | 01 |
| කලාප අධ්‍යාපන කාර්යාලය - කැලණිය | 01 |
| කලාප අධ්‍යාපන කාර්යාලය - කොළඹ | 02 |
| කලාප අධ්‍යාපන කාර්යාලය - ජයවර්ධනපුර | 01 |
| කලාප අධ්‍යාපන කාර්යාලය - පිළියන්දල | 01 |
| කලාප අධ්‍යාපන කාර්යාලය - හෝමාගම | 01 |
| කලාප අධ්‍යාපන කාර්යාලය - කළුතර | 01 |
| කලාප අධ්‍යාපන කාර්යාලය - හොරණ | 01 |
| කලාප අධ්‍යාපන කාර්යාලය - මතුගම | 01 |
| කෘෂිකර්ම, ඉඩම්, වාරි මාර්ග සත්ත්ව නිෂ්පාදන,සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන, කටයුතු අමාත්‍යාංශය (බ.ප.) | 06 |
| පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 18 |
| සේවා සංස්කරණ පුහුණු ආයතනය - බෝඹුවල | 02 |
| දිස්ත්‍රික් පුහුණු මධ්‍යස්ථාන (හොරණ, හෝමාගම, වල්පිට, අඹේපුස්ස) | 08 |
| පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව | 03 |
| පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව | 04 |
| පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | 33 |
| තෘණ සම්පත් සංවර්ධන මධ්‍යස්ථානය - කොටදෙනියාව | 02 |
| සත්ත්ව නිෂ්පාදන පුහුණු මධ්‍යස්ථානය - කොටදෙනියාව | 01 |
| සූකර සංවර්ධන ආයතනය - වැලිසර | 01 |
| | |



ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය :- 1/4/4/300 දිනය :- 2016/02/25

| | |
|---|---|
| සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා,කාන්තා කටයුතු සහ සභා කටයුතු අමාත්‍යාංශය (බ.ප.) | 06 |
| පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව | 02 |
| සහතික කළ පාසල රම්මුතුගල (ගැහැණු) | 01 |
| සහතික කළ පාසල මාකොළ (පිරිමි) | 01 |
| රැඳවුම් නිවාසය රම්මුතුගල (ගැහැණු) | 01 |
| රැඳවුම් නිවාසය මාකොළ (පිරිමි) | 01 |
| රජයේ නිවර්ථන නිවාසය | 01 |
| පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව | 06 |
| පළාත් ආයුර්වේද රෝහල මීගොඩ | 01 |
| පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව | 03 |
| ගංගොඩවිල නිවර්තන නිවාසය | 02 |
| මීරිගම වැඩිහිටි නිවාසය | 01 |
| මන්ද මානසික ළමා නිවාසය - මීරිගම | 01 |
| මන්ද මානසික ළමා නිවාසය - දෙහිවල | 01 |
| ධීවර, මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන,වෙළඳ,නිවාස හා ඉදිකිරීම් වතු යටිතල පහසුකම්,කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශය (බ.ප) | 08 |
| පළාත් සමුපකාර දෙපාර්තමේන්තුව | 05 |
| පළාත් සමුපකාර සේවක සංඛ්‍යා කොමිෂන් සභාව | 01 |
| පළාත් මොටර් රථ ප්‍රවාහන කොමසාරිස් කාර්යාලය | 03 |
| ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව | 01 |
| පළාත් කර්මාන්ත දෙපාර්තමේන්තුව | 08 |
| නිවාස ඒකකය | 01 |
| | **1710** |

මෙම තනතුරු සංඛ්‍යාව මුරෙ 71 විධිවිධාන අනුව කලින් කලට කාර්ය මණ්ඩලයට සිදු කරනු ලබන සංශෝධනයන් හේතුවෙන් වෙනස් විය හැකිය.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : 1/4/4/700 දිනය : 2016/02/25

ඇමුණුම 02

<u>බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ ඒකාබද්ධ රියදුරු සේවයේ II, I, විශේෂ ශ්‍රේණියට උසස්වීම් ලබාගැනීම සඳහා වූ අයදුම්පත</u>

1. නිලධරයා පිළිබඳ තොරතුරු

1.1 අයදුම්කරුගේ සම්පූර්ණ නම : ..............................................................................

1.2 හැඳුනුම්පත් අංකය : ..............................................................................

1.3 සේවා ස්ථානය සහ එහි ලිපිනය : ..............................................................................

1.4 අයත් වන සේවය හා තනතුර : ..............................................................................

1.5 අයත්වන සේවා ගණය හා ශ්‍රේණිය : ..............................................................................

2. පත්වීම පිළිබඳ තොරතුරු

2.1 පත්වීම් දිනය : ..............................................................................

2.2 පත්වීම ස්ථිර කළ දිනය : ..............................................................................

2.3 සමත් වූ කාර්යක්ෂමතා කඩඉම හා සමත් දිනය :

| සමත් වූ කාර්යක්ෂමතා කඩඉම | සමත්විය යුතු දිනය | සමත් වූ දිනය |
|---|---|---|
| | | |

2.4 සමත් වූ භාෂා ප්‍රවීණතා මට්ටම හා සමත් දිනය :

| සමත් වූ භාෂා ප්‍රවීණතා මට්ටම | සමත්විය යුතු දිනය | සමත් වූ දිනය |
|---|---|---|
| | | |

3. උසස්වීමට අදාළ තොරතුරු

3.1 උසස්වීමට අපේක්ෂිත ශ්‍රේණිය : II / I / විශේෂ

3.2 උසස්වීමට අපේක්ෂිත ධාරාව : සාමාන්‍ය

3.3.1 අවශ්‍ය සක්‍රිය සේවා කාලය සම්පූර්ණ කර තිබේද? ඔව් / නැත

3.3.2 සක්‍රිය සේවා කාලය සම්පූර්ණ කළ දිනය ..........................................

3.3.3 අපේක්ෂිත සක්‍රීය සේවා කාලය තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට අදාළ මට්ටමේ

ගරු ආණ්ඩුකාරතුමා විසින් ... කරන ලදී.
ගොනු අංකය 1/4/4/306 ... 2016/02/25

කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබේද? ඔව් / නැත

3.3.4 නියමිත වැටුප් වර්ධක සියල්ල උපයාගෙන තිබේද? ඔව් / නැත
උසස්වීමට පූර්වාසන්න පස් වසර තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබේද? ඔව්/නැත

3.3.5 විනය දඬුවම් ලබා තිබේද? ඔව් / නැත

3.4.6 විභාගයේදී ලබාගත් ලකුණු ප්‍රමාණය : ........................................

4. අයදුම්කරුගේ ප්‍රකාශය

ඉහත සඳහන් සියලු තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් ,මා හට විරුද්ධව නොනිමි විනය පරීක්ෂණයක් නොමැති බවත් ............................ දින සිට සාමාන්‍ය කාර්යසාධනය යටතේ II / I / විශේෂ ශ්‍රේණියට උසස්වීමට අදාළ සුදුසුකම් සපුරා ඇති බවත් සහතික කරමි.

දිනය : ........................................ ........................................................
නිලධරයාගේ අත්සන

5. ආයතන ප්‍රධානිගේ නිර්දේශය

ඉහත සඳහන් සියලු තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් , ඉහත සඳහන් ........................................ මහතා .......................... සේවා ගණයේ ...........................ශ්‍රේණියට සාමාන්‍ය කාර්ය සාධනය යටතේ උසස් කිරීම සඳහා වූ සියලු කරුණු සම්පූර්ණ කර ඇති බවටත්, සෑහීමකට පත්වෙමි. ඒ අනුව එම නිලධරයා ඉහත ශ්‍රේණියට උසස් කිරීම නිර්දේශ කරමි.

අත්සන : ............................................................

නිල මුද්‍රාව :

6. දෙපාර්තමේන්තු ප්‍රධානිගේ නිර්දේශය

ආයතන ප්‍රධානි විසින් ඉහතින් දක්වා ඇති කරුණු නිවැරදි බවත් /නිවැරදි නොවන බවත් ,ඒ අනුව ඉහත නිර්දේශ හා එකඟ වන බවත් / නොවන බවත්, කාරුණිකව දන්වමි.

අත්සන : ..........................................................

නිල මුද්‍රාව :

7. පත්වීම් බලධරයාගේ අනුමැතිය

ඉහත සඳහන් ......................................................... මහතා රියදුරු සේවයේ ............................ ශ්‍රේණියට සාමාන්‍ය කාර්ය සාධනය යටතේ .................................... දින සිට උසස් කිරීම අනුමත කරමි.

අත්සන : ..........................................................

නිල මුද්‍රාව :

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : 1 (4)4) 30 දිනය : 2016/02/25